**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - 2019**

-----------------------------------------------------------

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව,වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

----------------------

**(අ) නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත | 2019 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ රු.51,262,544 ක ශේෂය කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලද පසු ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ආයෝජනය කිරීමට කටයුතු කල යුතු බව. |
| ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | 2018 සහ 2019 අ.පො.ස (සා.පෙළ) සිසුන් සඳහා බස වඩමු - හද දිනමු අත්පොත් 22,500ක්, රු.6,615,000 ක් | අදාල පෙළපොත්, රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මුද්‍රණ කටයුතු අප ආයතනය හරහා සිදු කර ඇති අතර, | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 753(1) හා (2) | වැය කර මුද්‍රණය කර තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර නොතිබුණි. | ආයතනය තුළ පොත්පත් ගබඩා කර තැබීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හා කාර්යාල කාර්ය සහායකයකු නොමැති අවස්ථාවලදී පොත්පත් නිකුත් කිරිම ගැටළු සහගත වු බැවින් බිම් මහලෙහි ආරක්ෂක නිළධාරින්ගේ ඍජු අධීක්ෂණය යටතේ ගබඩා කර තබා ඇත. තවද, ආයතනයේ බාහිර නිළධාරීන් වෙත නිකුත්කරන සෑමවිටම පූර්ව ලිඛිත ඉල්ලීමක් මත පමණක් නිකුත් කිරීම සිදුකර ඇත. | |
| iii. 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදි සම්බන්ධීකරණ සහායකවරුන් ලෙස උපාධිධාරින් 12 දෙනෙකු සඳහා රු. 1,500 බැගින් රු.1,253,700ක් හා අභ්‍යාසලාභී පුහුණුවන්නන් 3 දෙනෙකු සඳහා රු.1,000 බැගින් රු. 221,975ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කර තිබුණි. | ජාතික අයවැය යෝජනාවකට අනුව භාෂා පුහුණුකරුවන් 1300ක් පුහුණු කිරිමේ වැඩසටහනට අදාලව සිදු කලයුතු කාර්යයන් ඉටු කිරිමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ආයතනයේ නොමැති බැවින් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත තාවකාලික පදනම යටතේ සම්බන්ධීකරණ සහායකවරුන් සහ අභ්‍යාසලාභී පුහුණුවන්නන්ගේ සේවය ලබා ගැනීම හා ගෙවීම් සිදු කරන ලදි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

**(ආ) ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී දන්නවනම් උගන්වන්න - දන්නේ නැත්නම් ඉගෙනගන්න වැඩසටහන ගුවන්විදුලියෙන් ප්‍රචාරය කිරීම වෙනුවෙන් හා සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් රු.15,323,972ක් හා රූපවාහිනි වැඩසටහන වෙනුවෙන් රු. 4,278,635 ක් වැය කර තිබුණු අතර මෙම සේවයන් ලබා ගැනීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2, 6.3.3,8.9.1 හා 8.9.1. (ආ) මාර්ගෝපදේශවලින් බැහැරව කටයුතු කර තිබුණි. | එකඟ වේ. ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතු බව. |

**(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **i.** 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 වන දින දක්වා දන්නවනම් උගන්වන්න - දන්නේ නැත්නම් ඉගෙනගන්න වැඩසටහන වෙනුවෙන් ගුවන් විදුලි සංස්ථාවට ප්‍රචාරන වියදම් ලෙස රු.29,952,931ක් හා ගුවන්විදුලි වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් පෞද්ගලික ප්‍රචාරණ ආයතනයට රු. 7,439,125ක් ගෙවා තිබුණි.ගුවන් විදුලි සේවාවන් 7 ක් ඔස්සේ දීප ව්‍යාප්තව මෙම වැඩසටහන ප්‍රචාරය කළද, අපේක්ෂිත පරිදි පාසල් ළමුන් අතර මෙම වැඩසටහන කොතරම් දුරට ප්‍රචලිතද යන්න හා අපේක්ෂිත අරමුණු කොතෙක් දුරට ඉටු වී ඇත්ද යන්න පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | වැඩසටහන සම්බන්ධයෙන් එවකට පර්යේෂණ හා පසු විපරම් සඳහා මුදල් වෙන් කිරීමක් නොවූ බැවින් විධිමත් පර්යේෂණ සිදු නොවූවද, වාර්ෂිකව පැවැත්වූ අ.පො.ස.(සා/පෙළ) වැඩසටහන්වලදී මේ සඳහා ඉහළ ප්‍රතිචාරයක් ලැබී තිබී ඇත. | වැඩසටහන් ක්‍රියාත්මක කළ පසු එහි පසුවිපරම් කටයුතු සිදු කළ යුතු බව. |
| **ii.** අයවැය යෝජනා අනුව භාෂා පුහුණුකරුවන් 1800ක් පුහුණු කිරීම සඳහා රු. 3,079,807ක වියදමක් දරා තිබුණු අතර ඉන් 1,746,126ක් කැබිනට් අනුමැතිය ලැබීමට පෙර වැය කර තිබුණි. මෙම වැඩසටහන අතරමඟ නවතා දැමීමෙන් මෙතෙක් දරන ලද රු.3,079,807 ක වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණු අතරම වැඩසටහනේ එකඟ වූ ගිවිසුම මත තවදුරටත් රු. 28,705,303 ක මුදලක් ගෙවිය යුතු විය. | එවකට සිටි විෂයභාර ඇමතිවරයාගේ උපදෙස් පරිදි කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය පරිදි ආයතනය කටයුතු කර ඇත. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් හා භාණ්ඩාගාරයේ නිලධාරීන් සමඟද සාකච්ඡා කර ඇති අතර එම නිරවුල් කිරීමට ඇති මුදල පිළිබඳ නිශ්චිත උපදේශයක් අප වෙත ලැබී නොමැත. | නිසි අනුමැතිය ලබා ගැනීමෙන් පසු වියදම් දැරිය යුතු බව. |
| **iii.** ආයතනය සතු රු. 350,000ක් වටිනා ත්‍රිවීල් රථය වර්ෂ 3ක කාලයක සිට හා රු.3,150,000 ක් වටිනා මෝටර් කාර් රථයක් සමාලෝචිත වර්ෂය තුළදීම ධාවනයට යොදාගෙන නොතිබුණි. | ත්‍රිරෝද රථය ආයතනයේ තබා ගැනීම හෝ අපහරණය පිළිබඳ ඉදිරියේදි කටයුතු කරමු.<br>පුරප්පාඩු පවතින රියදුරු තනතුරු දෙක සඳහා බඳවා ගැනීමෙන් අනතුරුව අදාල මෝටර් රථය සඳහා රියදුරෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනය සතු වත්කම් ප්‍රයෝජනයට ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| iv. | නිසි අවශ්‍යතාවයන් හඳුනාගැනීමකින් තොරව අගලවත්ත පුහුණු මධ්‍යස්ථානයට 2015 වර්ෂයේදී මිලදීගත් රු. 295,924 ක් වටිනා රෙදිසෝදන යන්ත්‍ර 2ක් 2020 වර්ෂයේ ජීව කාලය අවසන් වන තෙක් භාවිතයට ගෙන නොතිබුණි. | 2015 වර්ෂයේදී අගලවත්ත පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාර 02 සඳහා ප්‍රයෝජන ගැනීමේ අරමුණින් මිලට ගෙන ඇත. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සුදුසු තිරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ. | නිසි අවශ්‍යතාවයන් හඳුනාගැනීමකින් අනතුරුව මිලදීගැනීම් සිදු කළ යුතු බව. |

**(ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 41 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 35 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ 6 ක පුරප්පාඩු සංඛ්‍යාවක් නිරීක්ෂණය විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවුවද, සුදුසු අයදුම්කරුවකු ඉදිරිපත් නොවීම මත හා ද්විතීය හා ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා මැතිවරණ කටයුතු නිසා ස්ථිරවම බඳවාගත නොහැකි විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු බව. |